**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021 | 8 ශ්‍රේණිය

Diaganostic Test | Grade 8

බුද්ධ ධර්මය I,II | පැය දෙකයි

Buddhism I,II | Two hours

**නම /විභාග අංකය** ......................................................................................

❖ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

1 ‘ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ’ යන ගාථාවට අනුව ධර්ම රත්නයේ ගුණ

i 7 කි. ii 5 කි. iii 6 කි.

2 බුදුගුණ භාවනාවේ ආනිශංස ගණයට ඇතුළත් නොවන්නේ මින් කුමන කරුණද ?

i කායික හා මානසික සංවරය ඇතිවීම යි. ii සිත තුළ දරුණු මළානික ගති ඇතිවීම යි.

iii රාග, දෝෂ, මෝහ සිතිවිලි යටපත් වීම යි.

3 කාන්තාවන්ට පැවිද්ද ලබා ගැනීම සඳහා මුලිකත්වය ගෙන කටයුතු කළ කාන්තාව වන්නේ,

i විශාඛා සිටුදේවිය යි. ii යශෝධරා දේවිය යි.

iii ප්‍රජාපතී ගෝතමී දේවිය යි.

4 ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර

සිඳ බිඳ දුක් සසර - අහෝ දෙව්දත් නොදිටි මොක්පුර ......යන කවිය සඳහන් ග්‍රන්ථය වන්නේ

i සිරිත් මල්දම යි. ii ලෝවැඩ සඟරාව යි.

'iii ගුත්තිල කාව්‍යය යි.

5 ‘ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහනසේ මිහිරි යහපත් වචන කථා කරති. මැනවින් කරුණු දක්වති. දියුණු මිනිසුන්ගේ වචනම කියති. පිළිගත හැකි දේම තෙපළති’. බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව මෙම ප්‍රකාශය කළේ,

i සෝණදණ්ඩ බමුණාය. ii පොට්ඨපාද බමුණාය.

iii චංකී බමුණාය.

❖ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්න නිවැරදි නම් ( √ ) ලකුණද වැරදි නම් ( x ) ලකුණද යොදන්න.

06 අනතිමානි බව යනු අතිමානයෙන් යුක්ත බවයි. ( )

07 අරියවංශ ධර්ම දේශනා පැවත්වීම පැරණි බෞද්ධයින් සිදු කළ ආගමික චාරිත්‍රයකි. ( )

08 කාන්තා පැවිද්ද ආරම්භ කරන ලද්දේ ප්‍රජාපති ගෝතමිය විසිනි. ( )

09 තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නඟා ගැනීමට සුදුසු බැවින් ධර්මය “ඒහිපස්සිකෝ ” වේ. ( )

10 නන්ද කුමාරයාගේ පියා සුද්ධෝදන රජතුමා ය. ( )

❖ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(මහෞෂධ පණ්ඩිත/සැරයුත් තෙරණුවෝ/ මුගලන් තෙරණුවෝ / භුත්තානුමෝදනාව/ ඉස්සරිය වොස්සග්ග/සන්දිට්ඨික)

11 උපාය කුසලතාවයෙන් යුතු ව ගැටලුවකට මුහුණ දීමට හා ඒවා විසඳා ගැනීමට උම්මග්ග ජාතකයේ ........................................................ චරිතය අපට මඟ පෙන්වයි.

12 යම් අයෙකුට මෙලොවදී ම දැන, දැක ගත හැකි බැවින් ධර්මය .............................. නමින් හැඳින්වේ.

13 පිරිකර පූජාවෙන් පසුව දානයේ ආනිශංස පැහැදිලි කරමින් .............................. නම් වූ ධර්ම දේශනාවක් පවත්වනු ලැබේ.

14 .............................. පිරිනිවන් පෑමට ආසන්න අවස්ථාවේ සිය මෑණියන් වූ රූපසාරි බැමිණියට නිවන් මඟ කියා දී සෝවාන් ඵලයෙහි පිහිට වූහ.

15 ස්වාමිපුරුෂයා විසින් තම බිරිඳ කෙරෙහි ඉටු කළ යුතු යුතුකම් අතර නිවසේ හා පවුලේ වගකීම් පවරා දීම .............................. නමින් හැඳින්වේ.

❖ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට 'අ' කොටසට ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරා යා කරන්න.

| | අ | ආ |
|---|---|---|
| 16 | සෘද්ධි බලයෙන් අගතැන් වූ රහතන් වහන්සේ වන්නේ | ආයුක්ඛය |
| 17 | ආයුෂ ගෙවී යාම | ආනන්ද හාමුදුරුවෝ |
| 18 | ත්‍රිවිධ රත්නය | සැරියුත් , මුගලන් |
| 19 | අගසවු දෙනම | මුගලන් තෙරණුවෝ |
| 20 | දීඝ නිකාය | බුද්ධ , ධම්ම, සංඝ |

## II - කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01 I මහනෙල් සුවඳමය..... යන කවිය සම්පූර්ණ කරන්න.
II දහම් ගුණ දෙකක් නම් කරන්න.
III බුදු ගුණ භාවනාවේ ආනිශංස දෙකක් නම් කරන්න.
IV අගසව් දෙනමගේ ගිහිකළ නාමයන් ලියන්න.
V ශිලය යනු කුමක්ද?
VI සතර සංග්‍රහ වස්තු නම් කරන්න.
VII වේදේහ රජුට අනුශාසනා කළ පඬිවරු දෙදෙනෙක් නම් කරන්න.
VIII පංචවරය ඉදිරිපත් කළ භික්ෂූන් වහන්සේගේ නම කුමක්ද?
IX සිගාලෝවාද සූත්‍රයට අනුව හිත මිතුරු සබඳතාවය නියෝජනය වන්නේ කවර දිශාවෙන්ද?
X බෝසතාණන් වහන්සේගේ ප්‍රඥාව විදහා දැක්වෙන ජාතක කථාව කුමක්ද?

02 I බුදුගුණ මෙනෙහි කරමින් කරනු ලබන භාවනාව නම් කරන්න. (ලකුණු 2)
II බුද්ධ රත්නයේ ගුණ ඇතුළත් ගාථා පාඨය ලියන්න. (ලකුණු 2)
III බුදුගුණ භාවනාවේ ආනිශංස 6 ක් ලියන්න. (ලකුණු 6)

03 I බුදුරදුන් මැදිහත් වී ගැටලු විසඳූ අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 2)
II ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 2)
III ඔබට පන්ති කාමරයේදී පැමිණි ගැටලු විසඳා ගැනීමට බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ 06 ක් ලියන්න. (ලකුණු 6)

04 I අට වැදෑරුම් දුක්වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
II ඉන් එකක් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 2)
III තණ්හාවට වහල් නොවී සාර්ථක ජිවිතයක් ගොඩ නඟා ගන්නා ආකාරය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 6)

05 I සිරිත් හා විරිත් යනු මොනවාද? (ලකුණු 2)
II අපේ ජිවිතය හා බැඳි පවතින සිරිත් 03 ක් ලියන්න. (ලකුණු 2)
III ඔබගේ උපන්දිනය සමාජයේ යහපතට හේතුවන අයුරින් සමරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6)

06 I බුද්ධ කාලයේ ජිවත් වූ අන්‍ය ආගමිකයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
II ඉන් එක් අයෙකු බුදුරදුන් අගය කළ ආකාරය ලියා දක්වන්න. (ලකුණු 2)
III බෞද්ධ ජනතාව ආගන්තුක සත්කාරය සිදුකරන අවස්ථා පෙන්වා දෙන්න. (ලකුණු 6)

07 පහත මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

I හිත මිතුරු සබඳතා
II අටසිල්
III මුගලන් මහරහතන් වහන්සේ
IV දානමය පිංකම (02 x 05= 10 )

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Sabaragamuwa Provincial Department of Educition

අනාවරණ පරීක්ෂණය - 2021 | 8 ශ්‍රේණිය
Diaganostic Test | Grade 8

බුද්ධ ධර්මය I,II
Buddhism I,II

පිළිතුරු පත්‍රය
Answer Sheet

1 කොටස

1 iii
2 ii
3 iii
4 iii
5 i
6 x
7 √
8 √
9 X
10 √
11 මහෞෂධ පඬිතුමා
12 සන්දිට්ඨික
13 භුත්තානුමෝදනාව
14 සැරියුත් තෙරණුවෝ
15 ඉස්සරිය වොස්සග්ග
16 මුගලන් තෙරණුවෝ
17 ආයුක්ඛය
18 බුද්ධ, ධම්ම, සංඝ
19 සැරියුත් / මුගලන්
20 ආනන්ද තෙරණුවෝ

11 කොටස

01
I මහනෙල් සුවඳමය- කුඩමසු පිළි ගඳමය
දෙකට එක දියමය - හොඳට නරකට දෙකට කටමය
II 03 වන පාඩමේ 19 හා 20 පිටු
III 05 වන පාඩමේ 34 වන පිටුව
IV සැරියුත් හිමි- උපතිස්ස
මුලගන් හිමි- කෝලිත
V කය වචනය සංවර කර ගැනීමයි
VI දානය /ප්‍රිය වචනය/ අර්ථචරියාව/ සමානාත්මතාවය
VII සේනක/ පුක්කුස/ කාවින්ද/ දේවින්ද
VIII දේවදත්ත තෙරුණ්ය
IX උතුරු දිශාව
X උම්මග්ග ජාතකය

02
I බුද්ධානුස්සති භාවනාව (ලකුණු 2)
II ‘ඉතිපිසෝ භගවා’ යන ගාථාව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2)
III පෙළපොතේ 34/35 පිටුවල ඇති (ලකුණු 6)

03
I 1 පාඩම - 01 පිටුවේ සිට (ලකුණු 2)
II 1 පාඩම - 01, 02, 03 පිටුවේ සිට (ලකුණු 2)
III පිළිතුරට අදලව ලකුණු දෙන්න (ලකුණු 6)

04
I පෙළපොතේ 89 පිටුවේ ඇති දුක්වලින් දෙකක් (ලකුණු 2)
II සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 2)
III සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 6)

05
I සිරිත්- කළයුතු දේවල්
විරිත් - නොකළ යුතු දේවල් (ලකුණු 2)
II සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 2)
III සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 6)

06
I සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 2)
II සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 2)
III සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 6)

07 අදාළ පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.
I සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)
II සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)
III සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)
IV සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න. (ලකුණු 5)